# යක්ෂගෝත්‍රිකයන් පිළිබඳ නව සුසමාදර්ශය

ධාතුසේන රජතුමාට හා මහානාම හිමියන්ට වැරදුණේ කොතැන ද යන්න පැහැදිලි කරගත යුතු ය. මෙහි දී නැවත නැවතත් මතක් කරගත යුතු කරුණ නම් අප නව සුසමාදර්ශයක් (paradigm) ඉදිරිපත්කරන බවත් එහි වැරදි තිබිය හැකි බවත් හා ඒ ගැන තව තවත් අධ්‍යයනය කළයුතු බවත් ය. එහෙත් භෞතික විද්‍යාවේ හෝ ඉතිහාසයේ හෝ වෙනත් විෂයයක හෝ වේවා නව සුසමාදර්ශ ඉදිරිපත්කරන්නේ තව තවත් ගවේෂණයට මගපාදන්නක් ලෙස ය. ඒ කිසිම විටෙකවත් අවසාන වාක්‍යය යැයි නොසිතිය යුතු ය.

අපි නැවතත් අපේ සුසමාදර්ශය මතක්කර ගනිමු. වංසකතාවල සුසමාදර්ශය වී ඇත්තේ විජය රජුගෙන් පසුව මෙරට යක්ෂ සංස්කෘතිය හා ආධිපත්‍යය අභාවයට ගිය බව ය. වංසකතාවලට වෙනත් අරුතක් දීමට උත්සාහ ගත් අය, එසේත් නැතහොත් වෙනත් සුසමාදර්ශයක් ඉදිරිපත්කළ අය කියා සිටියේ පඬුඅබා රජු දවස යක්ෂ ගෝත්‍රිකයන් අර්ධ වෛදිකයන් පරාජය කර යක්ෂ ආධිපත්‍යය නැවත පිහිටුවූ බව ය. එහෙත් ඔවුන්ට පිළිතුරු දිය නොහැකි කරුණ නම් එසේ යක්ෂ ආධිපත්‍යයක් නැවත ඇති වී නම් ඒ පරාජය කර අර්ධ වෛදිකයන් බලයට පත්වූයේ කෙසේ ද යන්න ය.

අනෙක් අර්ථකථනයක් වූයේ (අප ද කලක් අනුමත කළ පරිදි) පඬුඅබා රජු දවස වැදි ගෝත්‍රය හැර අන් සියළු ගෝත්‍ර හා අර්ධ වෛදිකයන් එකතු වී සිංහල ජාතිය පිහිටු වූ බව ය. එහි දී යක්ෂ ගෝත්‍රිකයන් යම් පිරිසක් සිංහල ජාතියට එකතු වීමට විරුද්ධ වී යැයි අපි සිතුවෙමු. ඔවුන් කලින් කලට සිංහලයන් සමග එදිරිවාදුකම් ඇතිකර ගත් නමුත් ඒ එතරම් බලවත් පිරිසක් නොවී යැයි අපි සිතුවෙමු. එහෙත් අපට ප්‍රශ්න නොවුනා නො වේ.

පසුගිය සියවස වන තුරුම යක්ෂ අනන්‍යතාවක් පවත්වගෙන ගිය පිරිස් රටේ සිටි බව අපි දැන සිටියෙමු. පඬුඅබා දවස සිංහලයන්ට විරුද්ධව සිටි සිටි යක්ෂ ගෝත්‍රිකයන් සුළු පිරිසක් අවුරුදු දෙදහසකටත් වැඩි කාලයක් තිස්සේ තම අනන්‍යතාව රැකගත්තේ කෙසේ ද යන්න අපට ප්‍රශ්නයක් විය. ඒ අතර වංසකතාවල තනි සිද්ධි ලෙස කියැවුන ද රිටිගල ජයසේන හා වෙනත් යක්ෂ නායකයන් සම්බන්ධ ප්‍රවෘත්තිවලට එයට වැඩි වටිනාකමක් ඇති බව අපට ක්‍රම ක්‍රමයෙන් වැටහිණි. එපමණක් නොව සිංහලයන්ගේ කටහඬ ශබ්ද රටාව ආදිය උත්තර භාරතීයයන්ගෙන් වෙනස්වන බව ද අපි දුටුවෙමු. එමෙන් ම සිංහල භාෂාවේ ඇති ඇතැම් වචනවලට, එහෙත් අප බොහෝ විට යොදාගන්නා වචන වලට පාළි සංස්කෘත නිරුක්ති නොමැති බව ද පැහැදිලි විය.

අපට සංගීතයක් නැති බව බොහෝ පඬියන් කීව ද බෙර ආශ්‍රිත ව ගොඩනැගුණු සංගීතයක් අපට තිබුණු බව ද එහි සක් පිඹීම, හොරණෑව ආදිය ද වැදගත් බවත් අපට දැනගන්නට ලැබිණි. විශේෂයෙන් ම අනුරාධපුරයේ ඇති කැටයම්වලින් මේ සංගීත භාණ්ඩ පිලිබිඹු වෙයි. සංගිතය පිළිබඳ මගේ දැනුම අල්ප බැවින් මේ කරුණු සම්බන්ධයෙන් කරන ගවේෂණයක් වෙතොත් ඒ අගයමි.

ඒ සමග සිංහල භාෂාවේ ව්‍යාකරණය ඉතා කෘත්‍රිම වුවක් බව පැහැදිලි ය. සිංහල භාෂාවේ විභක්ති නවයක් ඇතැයි බොහෝ ව්‍යාකරණඥයන් පවසන නමුත් එය පාළි ව්‍යාකරණයට සිංහල භාෂාව කෙසේ නමුත් ඇතුල් කිරීමට ගත් උත්සාහයක් සේ පෙනිණි. අනුරාධපුර යුගයෙන් පසු මෙරට පහළ වූ විශිෂ්ට ම බුද්ධිමතා ලෙස සැලකිය හැකි කුමාරතුංග මුනිදාස මහතා සිංහල භාෂාවේ විභක්ති සංඛ්‍යාව හයක් පමණක් යැයි කියා බොහෝ කල් ය. එමෙන් ම සිංහල භාෂාවේ ක්‍රියා පද සම්බන්ධයෙන් ගත්කල පාළියෙහි මෙන් නොව ඇත්තේ අතීත කාලයක් හා අනතීත කාලයක් පමණක් බව ද කුමාරතුංග මහතා පවසා තිබිණි. මම යම් යනු වර්තමාන කාලය බවත් මම යන්නෙමි යන්න අනාගත කාලය බවත් කියන්නේ ඉතාමත් කෘත්‍රිම ව බව බුද්ධිමත් පාසල් ශිෂ්‍යයකුට වුව ද වැටහෙයි. එහෙත් අපට එකල කාලත්‍රයක් ගැන පාසලේ ඉගැන්වූයේ සිංහල භාෂාව ගැන ස්වාධීනව නොසිතීමේ ප්‍රතිඵලයක් ලෙස ය. දැන් නම් සිසුන්ට අතීත හා අනතීත කාල ගැන පමණක් ඉගැන්වෙයි. ඒ බුද්ධිමත් තීරණයක ප්‍රතිඵලයකි.

යක්ෂ ගෝත්‍රිකයන් හා නාග වැනි අනෙක් ගෝත්‍රිකයන් කතාකෙළේ යැයි අපවත් වී වදාළ බද්දේගම විමලවංස නාහිමිපාණන් වහන්සේ සඳහන් කර ඇති හෙළ බසට කුමක් විණි ද? කුමාරතුංග මහතා පාළි භාෂාව මහාවිහාරික භික්ෂූන් වහන්සේ නිර්මාණය කෙළේ යැයි පවසා ඇත. අප ඒ නොපිළිගත්ත ද බෙල්ල, කට, ඔළුව වැනි සිරුරේ අංග හඳුන්වන නාම පද යක්ෂ ගෝත්‍රිකයන්ගේ බව පැහැදිලි ය. ඒ සමග කමත් බසද අපට යක්ෂ බසෙහි කොටසක් ලෙස හඳුනාගත හැකි ය. අපට කෙළිනවා වැනි ක්‍රියා පදයක් තිබිය දී ක්‍රීඩා කරනවා යනුවෙන් තවත් රූපයක්

© Prof. Nalin De Silva

සකස්කර ගෙන ඇත්තේ කරනවා යන්න එකතු කරමිනි. අද අපි ඉංගිරිසි ක්‍රියා පදවලින් ද එලෙස කරනවා ඇසුරෙන් ප්ලේ කරනවා, සෙන්ඩ් කරනවා (පරිගණක සන්නිවේදනයේ දී) වැනි රූප තනාගන්නෙමු. කරනවා යන්න එකතු කිරීමට සිදුවන්නේ බොහෝ විට වෙනත් භාෂාවලින් ක්‍රියා පද ගන්නා විට දී යැයි විශ්වාස කළ හැකි ය. එහි සංස්කෘතික ආධිපත්‍යවාදයක් වෙයි.

අප කලින් සඳහන් කර ඇති පරිදි වංසකතාවලින් යක්ෂ ගෝත්‍රිකයන් ඉවත්කර ඇති බැවින් ඔවුන් හා සම්බන්ධ ඇතැම් සිද්ධි දෙමළ ජනවාර්ගිකයන්ට පවරා ඇති බව පෙනී යයි. විජිතපුර සටනට ගිය ගැමුණු කුමරුට මහවැලි ගඟින් එතරවීමට දෙමළ දෙතිස් බළකොටු බිඳින්නට වී ය යන්න එයට උදාහරණයකි. මේ සියළු කරුණු මෙතෙක් පැවතෙන සුසමාදර්ශය යටතේ තේරුම් ගැනීමේ දී පරස්පරවලට මුහුණ පෑමට සිදුවෙයි. එබැවින් අපි සුසමාදර්ශය වෙනස් කෙළෙමු. අප දැන් කියන්නේ පඬුඅබා රජුගෙන් පසුව සිංහල ජාතිය ඇති වූ නමුත් එයට එකතු නොවුණු යක්ෂ ගෝත්‍රිකයන් විශාල පිරිසක් සිටි බව ය. ඒ පිරිස දිගින් දිගට ම සිංහල ජාතිය සමග සටන්කර ඇත. ගැමුණු කුමරුට බිඳීමට සිදු වූ දෙතිස් බළකොටු යක්ෂ ගෝත්‍රිකයන්ගේ නිර්මාණ වූ අතර එළාර රජු ද දෙමළ නො වී ය.

ක්‍රමයෙන් වැඩීගෙන ආ යක්ෂ ගෝත්‍රික බලකාය ශක්තිමත් ම ස්ථරයකට පත් වී ඇත්තේ කාශ්‍යප කාලයේ බව අපේ වැටහීම ය. මේ වන විට හෙළ බසට පාළියෙහි බලපෑම තදින් ම දැනෙන්නට ඇති අතර යක්ෂ ගෝත්‍රිකයන් එයට ද විරුද්ධ වන්නට ඇත. මහානාම හිමියන් කලාවැව තැනීමට ධාතුසේන රජුට උපදෙස් දීම යක්ෂ ගෝත්‍රිකයන්ගේ සතුටට හේතු වී යැයි සිතිය නො හැකි ය. එය වැව් තැනීමේ පැරණි යක්ෂ සම්ප්‍රදායට මුළුමනින් ම විරුද්ධ විය. අහසින් වැටෙන ජලය එක්රැස්කරගෙන වැව් නිර්මාණය කරනු වෙනුවට ගංගා ඔය ආදිය හරස්කර වැව් නිර්මාණය යක්ෂ ගෝත්‍රික සම්ප්‍රදායට විරුද්ධ ය.

වැව හෙළ යක්ෂයන්ගේ අනගි නිර්මාණයක් විය. සිංහලයන් ඒ වෙනස්කිරීමට යක්ෂයන් විරුද්ධ වී නම් ඒ ස්වාභාවික ය. ඇතැම් විට මහානාම හිමියන් ධාතුසේන රජුට ගෝණ ඔය හරස්කර කලාවැව තැනීමට උපදෙස් දෙන්නට ඇත්තේ ජනගහණය වැඩිවීම හෝ වෙනත් කරුණක් හෝ නිසා යක්ෂ සම්ප්‍රදාය මත පමණක් ඉදිකෙරුණු වැව් ප්‍රමාණවත් නොවීම නිසා විය හැකි ය. එහෙත් යක්ෂ ගෝත්‍රිකයන් ඒ ගැන සිතන්නට ඇත්තේ වෙනත් ආකාරයකට ය. ඔවුන් එය දකින්නට ඇත්තේ සිංහල ජාතියේ ආධිපත්‍යය පැතිරවීමක් ලෙස ය. දෙමළ ආක්‍රමණිකයන්ට එරෙහිව ධාතුසේන කුමරු මෙහෙය වූ මහානාම හිමියනට මහාවිහාරයට අයත් නැති භික්ෂූන් වහන්සේට ද විහාර පූජාකිරීමට ධාතුසේන රජුට අනුබල දෙන්නට ඇතැයි සිතිය හැකි මහානාම හිමියනට යක්ෂ ගෝත්‍රික සම්ප්‍රදායට එරෙහිව වැව් තැනීම නොමනා කටයුත්තක් යැයි නො සිතුණේ ද?

යක්ෂ ගෝත්‍රිකයන් සියළු බල යොදා රාජ්‍ය බලය පැහැරගැනීමට සිතන්නට ඇත්තේ ඔවුන් ද යම් ප්‍රමාණයකට බලවත් ව සිටි නිසා විය යුතු ය. එහි දී ඔවුනට ලැබුණු ප්‍රධාන ම දායාදය කාශ්‍යප කුමරුන් ය. විජය කුමරු යක්ෂ ගෝත්‍රික කුමාරිකාවක යොදා ගනිමින් යක්ෂයනට විරුද්ධව සටන්කළාක් සේ යක්ෂ ගෝත්‍රිකයන් පිය පාර්ශ්වයෙන් සිංහල ජාතියට අයත් කාශ්‍යප කුමරු සිංහලයන්ට එරෙහිව යොදාගෙන ඇති බව පෙනී යයි. ඉතිහාසය සැම විට ම එකම ආකාරයෙන් ක්‍රියාත්මක නොවුවත් ඇතැම් විට එකම විධික්‍රමය විරුද්ධ කටයුතු සඳහා යොදා ගැනෙයි.

කාශ්‍යප ධාතුසේන අවුල වංසකතාවෙන් කියැවෙන ආකාරයට වුව ද කලාවැව වටා සූත්‍රගත වෙයි. කාශ්‍යප කුමරු වස්තුව ඉල්ලයි. ඒ කලාවැවේ සඟවා ඇතැයි ධාතුසේන රජු. ධාතුසේන රජු කලාවැවට ගොස් දිය දෝතක් ගෙන මේ මගේ වස්තුව යැයි පවසයි. කාශ්‍යප කුමරු ධාතුසේන රජු බිත්තියට තබා මැටි ගසා මරා දමයි. කලාවැව රජුට වස්තුවක් වුවාට යක්ෂ ගෝත්‍රිකයන්ට වස්තුවක් නොවූ බව පැහැදිලි ය. ධාතුසේන රජු ද අවසාන මොහොත එළඹි බව දැන කලාවැව තමන් සතු එකම වස්තුව යැයි කියන්නට ඇත.

මහාවංසයෙහි කෙසේ සඳහන් විණි ද ධාතුසේන රජුගේ මරණයෙන් පසුව කාශ්‍යප රජු බිය වූ බවක් නො පෙනෙයි. බිය වූයේ මුගලන් කුමරු ය. ඔහු භාරතයට පළා ගියේ ය. පීතෘ ඝාතකයකුට බියේ මුගලන් කුමරුට පළා යැමට සිදු වීමෙන් හා අවුරුදු දහඅටක් ම එහි ජීවත්වීමට සිදුවීමෙන් පෙන්නුම් කරන්නේ කාශ්‍යප රජුට යම් බලයක් රටේ තිබූ බව ය. රජවීමෙන් පසු කාශ්‍යප සිහිගිරියට පළාගියේ යැයි සිතීමට නොහැකි ය. මුගලන් කුමරු පළාගොස් ඇතිවිට කාශ්‍යප රජු පළා යන්නේ කුමක් සඳහා ද? ඔහු සිහිගිරිය තනන්නට ඇත්තේ යක්ෂ සංස්කෘතියට අනුව නිර්මාණයක් කළ යුතු යැයි සිතූ නිසා මිස බළකොටුවක් තනාගෙන බියෙන් ජීවත්වීමට නො වේ. කෙසේ වෙතත්

© Prof. Nalin De Silva

ඔහු සිංහල බෞද්ධයන් අමනාප කරගැනීමට ද නොසිතුවේ ය. රජු අනුරාධපුරයේ වාසය කරමින් වෙහෙර විහාර කර සිංහල බෞද්ධයන් සමීප කරගන්නට ඇත.

කාශ්‍යප රජු ඉසුරුමුණි විහාරය ප්‍රතිසංස්කරණය කර ගම් රාශියක් මිලට ගෙන විහාරයට දී ඇත. මෙයින් කියැවෙන වැදගත් කරුණක් ඇත. එනම් මෙරට රජුන්ට සියළු ඉඩම් හිමි නොවූ අතර රජුට ද ඉඩම් මිළ දී ගැනීමට සිදු වූ බව ය. අනුරාධපුර සමයේ මෙරට පැවතියේ යුරෝපීය වැඩවසම් ක්‍රමයක් යැයි කියන පඬියන් රජු ඉඩම් මිළ දී ගැනීම ගැන කියන්නේ කුමක් ද? අනෙක් අතට තමන්ගේ හා දියණියන්ගේ නමින් රජු කරවූ ඉසුරුමෙනු බෝ උපුල්වන් කසුබ් ගිරි විහාරය පිළිගැනීමට මහාවිහාර භික්ෂූන් වහන්සේ අකමැති වූහ. එහෙත් රජු එ විහාරය බුදුන්වහන්සේට පූජා කෙළේ ය. එ විහාරයට තිසාවැවෙන් නිතර ජලය සැපයිය යුතු බවට නියෝගයක් ද කෙළේ ය. එසේ ම සිහිගිරිය අසල උයනක ද විහාරයක් කරවා එයට ද  තමාගේ හා දූවරුන්ගේ නම් තැබී ය. එ විහාරය ද උතුරු දිග උයන ද ධර්ම රුචික නිකායේ භික්ෂූන් වහන්සේට පූජාකළ බව මහාවංසයේ සඳහන් වෙයි. මෙයින් පැහැදිලි වනුයේ කාශ්‍යප රජු සිහිගිරියේ වාසයට ගිය බව නොව සිහිගිරිය යක්ෂ සංස්කෘතිය අනුවත් අනුරාධපුරය සිංහල බෞද්ධ සංස්කෘතිය අනුවත් පවත්වාගෙන යෑමට ක්‍රියාකළ බව ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva